
සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | භූගෝල විද්‍යාව | 2 | 03. ලෝක ජන සංඛ්‍යාව |




සැකසුම: සුරංජි නිල්මිණි රොඩ්රිගෝ

බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලය

# නිපුණතාව

- ස්වාභාව ධර්මය හා සමාජය අතර සුසංයෝගී අන්තර් සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පෘථිවිය හා එහි වැසියන් පිළිබඳ මනා අවධානයකින් කටයුතු කරයි.



# ලෝක ජන සංඛාව.
# (WORLD POPULATION)

- පෘථිවිය මත වෙසෙන මුළු මිනිස් ගහනය ලෝක ජන සංඛ්‍යාව නම්වේ. 2015 වන විට ලෝක ජනගහනය බිලියන 7.3 වූ අතර 2020 වනවිට එය බිලියන 7.9 කි.
- මෙය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ද වෙනස්වන ප්‍රපංචයකි .



# ජන සංඛ්‍යාව සම්පතක් ලෙස

- රටක ජන සංඛ්‍යාව රටකට වත්කමකි.
- රටක ශ්‍රම බලකාය ඵලදායි නිපුනතා සහිත, වෘත්තීමය පුහුණුවක් ලත්, හැකියාවන්ගෙන් පිරි සෞඛ්‍ය සම්පන්න පිරිසක් වේ නම් ඔවුන් එරටට සම්පතක් ලෙස සැලකේ.
- ජන සංඛ්‍යාව පිළිබඳ සැලකීමේදී වැදගත් ක්ෂේත්‍ර දෙකකි.


එනම් ,


1. මිනිසාට උපතින්ම හිමිවන පුමිතිරි බව, මානව වර්ගය, වයස ආදී ලක්ෂණ.

2. පසුව උරුම කර ගනු ලබන ජාතිය, ආගම, භාෂාව, සාක්ෂරතාව වැනි ලක්ෂණ.

# ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය


- වර්තමාන ලෝක ජන සංඛ්‍යාව බිලියන හත ඉක්මවා ඇත.
- වසරකට මිලියන අසූවක් පමණ ලෝක ජන සංඛ්‍යාවට එකතු වේ.



# ජන සංඛ්‍යාවේ විශාලත්වය
## (ලෝක ජන සංඛ්‍යාව මහාද්වීප අනුව)

| මහාද්වීපය | ප්‍රතිශතය |
|---|---|
| ආසියා මහාද්වීපය | 60.39 |
| අප්‍රිකා මහාද්වීපය | 14.82 |
| යුරෝපා මහාද්වීපය | 10.70 |
| උතුරු ඇමරිකා මහාද්වීපය | 8.56 |
| දකුණු ඇමරිකා මහාද්වීපය<br>ඔස්ට්‍රේලියා මහාද්වීපය | 5.00<br>1.00 |



# ලෝක ජන සංඛ්‍යාව අධිකතම රටවල් - (2016)

| රට | ජන සංඛ්‍යාව -මිලියන |
|---|---|
| චීනය | 1406 |
| ඉන්දියාව | 1291 |
| එක්සත් ජනපදය | 323 |
| ඉන්දුනීසියාව | 257 |
| බ්‍රසීලය | 204 |
| පාකිස්තානය | 189 |
| නයිජීරියාව | 186 |
| බංගලාදේශය | 161 |
| රුසියාව | 141 |
| ජපානය | 126 |

# ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය

❖ ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන ප්‍රධාන අවධි දෙකකි. එනම් ,

1. දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී වර්ධනයක් සිදු වූ අවධිය. (මානව සංහතියේ ආරම්භයේ සිට ක්‍රි .ව.1750පමණ දක්වා යුගය.)
2. ක්‍රි .ව.1750පමණ සිට කෙටිකාලයක් තුල ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය.



# ජන සංඛ්‍යා ස්පෝටනය (EXPLOSION)

- මරණ අඩුවීමත්, උපත් අනුපාතය ඉහල යාමත් නිසා ජන සංඛ්‍යාවේ සිදුවන විශාල වැඩිවීම ජන සංඛ්‍යා ස්පොටනය ලෙස හැඳින්වේ.



# ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය .


- පෘථිවිය මතුපිට මිනිසා හූ ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇති ආකාරය හෙවත් විසිරී සිටින අකාරය ජන සංඛ්‍යා ව්‍යාප්තිය ලෙස හැදින්වේ. අසමානාකාරයට වර්තමානයේ දී ලෝක ජන සංඛ්‍යාව ව්‍යාප්තවී ඇත.



# ජන ඝනත්වය


❖ කිසියම් බිම් ඒකකයක් තුල ජීවත්වන ජන සංඛ්‍යාව ජන ඝනත්වය ලෙස හැඳින්වේ. එය වර්ග කිලෝ මීටරයට ගණනය කරනු ලැබේ.

ජන ඝනත්වය = ජන සංඛ්‍යාව / බිම් ප්‍රමාණය



❖ ජන සනත්වය පදනම් කරගෙන ලෝකයේ ප්‍රධාන ජන ව්‍යාප්ති කලාප තුනකට බෙදා තිබේ. එනම් ,

1) ජනාධික කලාප .
2) ජනහීන කලාප .
3) මධ්‍යස්ථ ජන සනත්වයක් සහිත කලාප .



# ලෝකයේ ජනාධික කලාප

❖ ජනාධික කලාප හතරකි. එනම්,

1. නැගෙනහිර ආසියාව.
2. දකුණු හා අග්නිදිග ආසියාව.
3. වයඹදිග යුරෝපය.
4. ඇමරිකාවේ ඊසාන දිග වෙරළබඩ කලාපය .

ලෝක භූමි ප්‍රමාණයෙන් අයත් වන්නේ 10% අයත් වුවත් ලෝක ජන සංඛ්‍යාවෙන් 64% ක් අයත්වේ.


# ලෝකයේ ද්විතියික ජන සංකේන්ද්‍රන

- උතුරු ඇමරිකාවේ නැගෙනහිර ,බටහිර හා ඊසානදිග වෙරළ කලාපය.
- දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළ බඩ කලාපය.
- නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය.
- බටහිර අප්‍රිකාවේ සියෙරා ලියොන්, ලයිබිරියාව, අයිවරි කෝස්ට්, ඝානාව යන රටවල් .



# ලෝකයේ ජන හීන ප්‍රදේශ

- ශීත කාන්තාර ප්‍රදේශ
- උෂ්ණ කාන්තාර ප්‍රදේශ
- කඳුකර ප්‍රදේශ
- නිවර්තන වර්ෂා වනාන්තර ප්‍රදේශ



# ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක

1. භෞතික සාධක .
   - දේශගුණය.
   - භූ විෂමතාවය .
   - ජලවහනය.
2. මානුෂ සාධක .
   - කර්මාන්ත ස්ථානගතවීම.
   - නාගරීකරණය.
   - වෙළඳ මධ්‍යස්ථාන.
   - වරාය පිහිටීම.
   - යටිතල පහසුකම් වර්ධනය.
   - විවිධ සේවාවන් ඒකරාශී වී තිබීම.
   - පරිපාලන කටයුතු ස්ථානගත වීම.



**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **11** | **භූගෝල විද්‍යාව** | **2** | **03. ලෝක ජන සංඛ්‍යාව - ඇගයීම** |

**සැකසුම: : සුරංජි නිල්මිණි රොඩ්රිගෝ**

**බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලය**

**පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1) "ලෝක ජන සංඛ්‍යාව " යනු කුමක්ද.?
2) වර්තමාන ලෝක ජන සංඛ්‍යාව කොපමණද?
3) ලෝක ජන සංඛ්‍යාවෙන් 76% කම වාසය කරන මහාද්වීප දෙක මොනවාද ?
4) ලෝක ජනාධික රටවල් තුනක් නම් කරන්න.
5) ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන අවධි දෙක ලියන්න.
6) ජන සංඛ්‍යා ස්පෝටනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
7) ජන ඝනත්වය යනු කුමක්ද?
8) ජන ඝනත්වය ගණනය කරන්නේ කෙසේද ?
9) ජනගහන ව්‍යාප්තිය යනු කුමක්ද ?
10) ලෝකයේ ජනාධික කලාප හතර නම්කරන්න.
11) ජනධික කලාප ඇතිවීමට බලපාන හේතු තුනක් ලියන්න.
12) ලෝකයේ ද්විතික ජන සංකේන්ද්‍ර කලාප හතර ලියන්න.
13) ලෝකයේ ජන හීන කලාප හතරක් ලියන්න.
14) ජන සංඛ්‍යාවේ අවම ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් ලියන්න.
15) ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරෙහි බලපාන මානුෂ සාධක මොනවාද ?

**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | භූගෝල විද්‍යාව | 2 | 03. ලෝක ජන සංඛ්‍යාව - පිළිතුරු |


**සැකසුම: : සුරංජි නිල්මිණි රොඩ්රිගෝ**

**බප/හො/ තක්ෂිලා මහා විද්‍යාලය**


1) පෘථිවිය මත වෙසෙන මුළු මිනිස් ගහනය ලෝක ජන සංඛ්‍යාව ලෙස හැඳින්වේ.
2) බිලියන 7.9 (2020)
3) ආසියා හා අප්‍රිකා මහාද්වීප වල .
4) ජනාධික රටවල් -චීනය ,ඉන්දියාව,ඇමරිකා එක්සත් ජනපදය .
5)
    a. මන්දගාමී වර්ධනයක් සිදු වූ අවධිය (මානව සංහතියේ ආරම්භයේ සිට ක්‍රි .ව.1750 දක්වා )
    b. ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය (ක්‍රි .ව.1750 පමණ සිට)
6) ජන ගහන ස්පෝටනය යනු කෙටි කාල සීමාවක් තුල ජනසංඛ්‍යාවේ සිදු වූ සීඝ්‍ර වර්ධනයයි.
7) ජන ඝනත්වය යනු කිසියම් බිම් ඒකකයක් තුල ජීවත්වන ජනසංඛ්‍යාවයි.
8) ජන ඝනත්වය සෙවීම සඳහා මුළු ජන සංඛ්‍යාව මුළු බිම් ප්‍රමාණයෙන් බෙදීමෙනි.
9) ජනගහන ව්‍යාප්තිය යනු පෘථිවිය මතුපිට මිනිසා භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇති ආකාරයයි.
10) නැගෙනහිර ආසියාව ,දකුණු හා අග්නිදිග ආසියාව , වයඹ දිග යුරෝපය, ඇමරිකාවේ ඊසානදිග වෙරළබඩ කලාපය
11) භූමියේ උස හා විෂමතාව ,දේශගුණය ,පස ,ජල සැපයුම , සම්පත් ,යටිතල පහසුකම් ,දේශපාලනික තත්වය .
12) උතුරු ඇමරිකාවේ නැගෙනහිර, බටහිර හා ඊසානදිග වෙරළබඩ කලාපය , දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළබඩ කලාපයේ ජන සංකේන්ද්‍රණය , නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය ,බටහිර අප්‍රිකාවේ සියේරා ලියොන් , ලයිබීරියාව, අයිවරිකොස්ට් , ඝානාව යන රටවල් ආශ්‍රිත සංකේන්ද්‍රණය .
13) ශීත කාන්තාර ප්‍රදේශ , උෂ්ණ කාන්තාර ප්‍රදේශ, කඳුකර ප්‍රදේශ, නිවර්තන වර්ෂා වනාන්තර ප්‍රදේශ .
14) භෞතික සාධක -දේශගුණය ,භූ විෂමතාව ,ජලවහනය.
15) මානුෂ සාධක -කර්මාන්ත ස්ථාන ගතවීම,නාගරීකරණය,වෙළඳ මධ්‍යස්ථාන ,යටිතල පහසුකම්